අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 1 - 2020
---------------------------------------------------------------

අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 1 හි 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2013 මාර්තු 14 දින එලඹි අංක එස් එල් -පී 110 දරන ණය ගිවිසුමේ ව්‍යාපෘති ලියවිල්ලේ 14 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කලයුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය
---------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.ව්‍යාපෘතියේ අරමුණු වනුයේ අනුරාධපුර උතුර ප්‍රදේශයේ ජල සම්පාදන පද්ධතියක් ඉදිකිරීම මඟින් ආරක්ෂිත පානීය ජලය සැපයීම හා ජල සම්පාදන ආවරණ ප්‍රදේශය වැඩිකිරීම සහ එමඟින් ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්ත්වයක් හා සෞඛ්‍ය තත්වයක් වර්ධනය කිරීම් වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 11,515 කට සමාන ජපන් යෙන් මිලියන 6,817 ක් වන අතර ඉන් රු.මිලියන 8,726 කට සමාන ජපන් යෙන් මිලියන 5,166 ක් මූල්‍යයනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය විසින් එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 පෙබරවාරි මස ආරම්භ කර තිබුණු අතර, 2018 පෙබරවාරි මස වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි. පසුව, ව්‍යාපෘති කාල සීමාව 2022 ජූලි 05 දින දක්වා දෙවරක් දීර්ඝ කර ඇත.

## 1.3 තත්ත්වාගණනය කළ මතය
---------------------------

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම
--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීමයන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
---------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.1** ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | මුදල රු.මිලියන | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|
| (අ) | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 2021 පෙබරවාරි 12 දිනැති අංක 01-2021 දරණ චක්‍රලේඛයෙන් ලබාදී ඇති උපදෙස් වලට පටහැනිව, රු.මිලියන 20.19 ක එකතු කළ අගය මත බදු වටිනාකම වෙන වෙනම නොපෙන්වා රජයෙන් ලැබුණු දායකත්වයට එරෙහිව හිලව්කර ඇත.එබැවින් එම වටිනාකමින් රජයෙන් ලැබෙන දායකත්වය අඩුවෙන් පෙන්වා ඇත. | 20.19 | 2014 වසරේ සිට ගෙවීම සිදුවූ බැවින් සහ 2021.02.12 දිනැති චක්‍රලේඛය මෑතකදී ලැබුණි. එකතු කළ අගය මත බදු මුදල රජයේ දායකත්වය ලෙස පෙන්වීමට අපි කටයුතු කරන්නෙමු. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ විශේෂ (යෙන්) ගිණුමේ මාසික බැංකු ප්‍රකාශණ විගණනයට ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් කෙරීගෙන යන වැඩ ගිණුමේ පෙන්වා ඇති 2020 දෙසැම්බර් 31 දින දක්වා වන විදේශ ගණුදෙනු වල විනිමය ලාභය රු.මිලියන 178.64 ක් විගණනයේදී සත්‍යාපනය කළ නොහැකි විය. | 178.64 | සෑම වසරකම අවසානයේ විශේෂ (යෙන්) ගිණුම් ප්‍රකාශය මහ බැංකුවෙන් ඉල්ලා සිටී. නමුත් මහ බැංකුව එවැනි වාර්ථාවක් නිකුත් කරන්නේ නැත. | මාසික බැංකු ප්‍රකාශණ විගණනයට ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | විදේශ විනිමය අනුපාත වෙනස්වීම්වල බලපෑම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ 39(අ) වගන්තියට අනුව (එල්.කේ.ඒ.එස්-21) විදේශ මුදල් ගෙවීම්වලට අදාළ පූර්ව වැඩ අත්තිකාරම් මුදල රු.මිලියන 133.08 ක් සහ 2020 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රඳවා ගැනීමේ මුදල රු.මිලියන 141.86 ක් අවසාන අනුපාතයට පරිවර්ථනය කර නොතිබුණි. | 274.94 | සාමාන්‍යයෙන් විදේශ මුදල් ගෙවීම් නියමිත ගෙවීමේ දිනයේ අනුපාතයට පරිවර්ථනය වේ. විගණනය මඟින් ඉදිරිපත්කරන වර්තමාන අදහස පිළිගනිමි. අපි 2021 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය ප්‍රකාශණයේ 2021.12.31 ට අනුව මුදල යාවත්කාලීන කරන්නෙමු. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 21 ප්‍රකාරව විදේශ මුදල් ගණුදෙනු ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |

## 2.2 ව්‍යාපෘතියේ අනෙකුත් තොරතුරු (හඳුනානොගත් ණය ශේෂය )

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| **2020** දෙසැම්බර් **31** න් අවසන් වර්ශය සඳහා ශ්‍රී ලංකා රජයේ මූල්‍ය ප්‍රකාශණවලට අනුව ව්‍යාපතියේ ණය ශේෂය රු.මිලියන **5,710.4** කි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශණ වලට අනුව ඉහත ශේෂය රු.මිලියන **5,360.7** කි. ඉහත ශේෂ දෙක අතර වෙනස වූයේ, රු.මිලියන **485.7** ක ණය ආපසු ගෙවීම් සහ මුදල් නැවත තක්සේරු කිරීමේ පාඩුව රු.මිලියන **835.4** කි. | ණය ආපසු ගෙවීම භාණ්ඩාගාරය විසින් සිදුකරනු ලැබේ. එබැවින් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ගිණුම්වල ආපසු ගෙවීම වාර්ථා නොකෙරේ. ඒ අනුව ආපසු ගෙවීම් අඩුකර මුදල් නැවත තක්සේරු කිරීම එකතු කළ පසු ශ්‍රී ලංකා රජයේ මූල්‍ය ප්‍රකාශණ ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශණ සමඟ සමපාත වේ. | ව්‍යාපෘතියේ අවසන් ණය ශේෂය ශ්‍රී ලංකා රජයේ මූල්‍ය ප්‍රකාශණයේ හා ව්‍යාපෘති ගිණුම්වල පෙන්වා ඇති ණය ශේෂය සමඟ ගැලපීමට පියවර ගත යුතුය. |

## 3 භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය **2013** පෙබරවාරි මස එහි කටයුතු ආරම්භ කරන ලද අතර වසර **05** ක් ඇතුලත **2018** පෙබරවාරි වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතියේ කාලසීමාව **2020** දෙසැම්බර් **31** දිනට ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කළ දින සිට වසර **07** කුත් මාස **10** ක් ගතවී තිබුණද, ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට **80.37** ක් සහ සියයට **50.94** ක් ලෙස පැවතුණි. තවද , එය **2021**සැප්තැම්බර් **30** වන විට පිළිවෙලින් සියයට **93.35** ක් සහ සියයට **61.50** ක් ලෙස පැවතිණි. **2020** දෙසැම්බර් **31** දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අනුව ප්‍රගතිය පහත පරිදි විය.

| අංකය | ක්‍රියාකාරකම | ඒකක | අපේක්ෂිත ඉලක්කය | 2020 දෙසැම්බර් 31 වන විට ළඟා කරගෙන ඇති ඉලක්කය | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|---|---|---|
| (අ) | උපදේශණ සේවාව | ප්‍රතිශතය | **89.8** | **87.2** | නියමිත කාල සීමාව තුළ අපේක්ෂිත උපදේශණ සේවාව ලබාගැනීමට නොහැකි වී ඇති අතර උපදේශණ කාලය දීර්ඝ කිරීමට හේතු විය හැක. | ජපන් සහයෝගිතා ආයතනයට අනුව ව්‍යාපෘතිය අවසන් වනතරු උපදේශණ සේවාව ලබාගත හැක. කොන්ත්‍රාත්කරුවන්ගේ ඉල්ලීමට හේතු ඇගයීමෙන් පසු ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම සඳහා ව්‍යාපෘති | කොන්ත්‍රාත්කරුවන් ගේ කටයුතු සමීපව අධීක්ෂණය කිරීමට උපදේශකයින් අවශ්‍ය වන අතර සංශෝධිත කාල රාමුවක් තුළ ව්‍යාපෘතිය නිම කිරිමට ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | කළමනාකරණ ඒකකයේ නිර්දේශය යටතේ සාමනාාධිකාරී විසින් කොන්ත්‍රාත්කරුවන්ට දීර්ඝ කිරීම් ලබා දී ඇත.ඒ අනුව උපදේශණ කොන්ත්‍රාත්තුවේ කාලය දීර්ඝ කිරීමට අවශ්‍ය වේ. | ගත යුතුය. |
| (ආ) | තුළමුව, පහසුකම්, ජල පවිත්‍රාගාරය, භූගත ජලාශ, ජල කුළුණු, කාර්යාල ගොඩනැගිලි, යාන්ත්‍රික හා විදුලි වැඩ (කැබලි අක්ෂර ඒ) | ප්‍රතිශතය | 91.4 | 73.0 | කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම ව්‍යාපෘති කාර්යසාධනයට අහිතකර ලෙස බලපෑ හැකිය. | 2021 නොවැම්බර් 30 වන විට 99.7% ක ඉලක්ක ගත ප්‍රගතියෙන් 96.7% ක් ළඟා කර ගෙන ඇත. සියළුම සිවිල් ඉදිකිරීම් කටයුතු පාහේ අවසන් කර ඇති අතර ආනයනය කරන ලද සියළුම යාන්ත්‍රික හා විදුලි අයිතම වැඩ බිමට භාර දී ඇත. 2021 නොවැම්බර් 30 වන විට යාන්ත්‍රික හා විදුලි ස්ථාපනයන්ගෙන් 94.51% ක් අවසන් කරන ලදී. | සංශෝධිත ව්‍යාපෘති කාලසීමාව තුළ ඉතිරි වැඩ අවසන් කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | සම්ප්‍රේෂණ ප්‍රධාන සහ උප ප්‍රධාන - මිලිමීටර් 110 සිට මිලිමීටර් 500 විශ්කම්භය දක්වා -කිලෝමීටර් 88.7 හා බෙදාහැරීම් ප්‍රධාන (අධි තාක්ෂණික පොලි එතලින් නල) - මිලිමීටර් 110 සිට මිලිමීටර් 400 | ප්‍රතිශතය | 83.5 | 81.8 | අනෙකුත් අදාළ කොන්ත්‍රාත්තු ප්‍රමාද වීම (කැබලි අක්ෂර සී-1 හා කැබලි අක්ෂර සී-3) සහ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම ව්‍යාපෘති කාර්ය සාධනයට | 2021 නොවැම්බර් 30 වන විට, 96.8% ක ඉලක්ක ගත ප්‍රගතියෙන් 92.94% ක් ළඟා කරගෙන ඇත. දෛනික පදනමින් වැඩ කටයුතු සමීපව නිරීක්ෂණය කරමින් කොන්ත්‍රාත්කරු වෙත කළාප අනුව වැඩ නිම කිරීමේ | ඉතිරි වැඩ අවසන් කිරීමට සහ කොන්ත්‍රාත්කරුගේ වැඩ සමීපව නිරීක්ෂණය කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | විෂ්කම්භය දක්වා - කිලෝ මීටර් 163 (කැබලි අක්ෂර බී) | | | | අහිතකර ලෙස බලපෑ හැකිය. | ඉලක්ක හඳුන්වා දෙනු ලැබේ. | |
| (ඈ) | ඉසින්බැස්සගල කලාපයේ යූ පී වී සී නල ඇතිරීම, සවිකිරීම් හා විශේෂ සහ මෘදු යකඩ හා ගැල්වනයිස් යකඩ නල ඇතිරීම, සවිකිරීම් හා විශේෂ (කැබලි අක්ෂර සී - 1) | ප්‍රතිශතය | 100 | 95.0 | කොන්ත්‍රාත්තුව අවසන් කිරීම ප්‍රමාද වීම ව්‍යාපෘති කාර්ය සාධනයට අහිතකර ලෙස බලපෑ හැකිය. | අවසන් කිරීමට ඇති එකම වැඩ අයිතමය නල ඇතිරීම්හි සෝදාහැරීම් හා විශබීජහරණය කිරීම වන අතර, එය කැබලි අක්ෂර බී කොන්ත්‍රාත්කරු විසින් කැබලි අක්ෂර බී හි නල මාර්ග සෝදාහැරීමෙන් පසු හා කැබලි අක්ෂර සී 1 හි නල මාර්ග කැබලි අක්ෂර බී නල මාර්ගයන්ට සම්බන්ධ කිරීමෙන් පසු කළ යුතුය. | කැබලි අක්ෂර සී -1 කොන්ත්‍රාත්තුවේ බෙදාහැරීම් මාර්ග සෝදාහැරීම හා විෂබීජහරණය කිරීම සම්පූර්ණ කිරීම සඳහා කැබලි අක්ෂර බී කොන්ත්‍රාත්තුවේ නල එලීමේ කටයුතු අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | රබෑව, නැගෙනහිර රබෑව සහ ඇතාකඩ කළාපයේ යූපීවීසී නල ඇතිරීම්, සවිකිරීම් හා විශේෂ සහ මෘදු යකඩ හා ගැල්වනයිස් යකඩ නල ඇතිරීම්, සවිකිරීම් හා විශේෂ (කැබලි අක්ෂර සී - 3) | ප්‍රතිශතය | 100 | 95.0 | කොන්ත්‍රාත්තුව අවසන් කිරීම ප්‍රමාද වීම ව්‍යාපෘති කාර්යසාධනයට අහිතකර ලෙස බලපෑ හැකිය. | අවසන් කිරීමට ඇති එකම වැඩ අයිතමය නල ඇතිරීම්හි සෝදාහැරීම් හා විෂබීජහරණය කිරීම වන අතර, එය කැබලි අක්ෂර බී කොන්ත්‍රාත්කරු විසින් කැබලි අක්ෂර බී හි නල මාර්ග සෝදාහැරීමෙන් පසු හා කැබලි අක්ෂර සී 3 හි නල මාර්ග කැබලි අක්ෂර බී නල මාර්ගයන්ට සම්බන්ධ කිරීමෙන් පසු කළ යුතුය. | කැබලි අක්ෂර සී -3 කොන්ත්‍රාත්තුවේ බෙදාහැරීම් මාර්ග සෝදාහැරීම හා විෂබීජහරණය කිරීම සම්පූර්ණ කිරීම සඳහා කැබලි අක්ෂර බී කොන්ත්‍රාත්තුවේ නල එලීමේ කටයුතු අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| (අ) | මුළු ව්‍යාපෘතියෙන් සියයට 35.15 ක බර තැබීමකින් යුක්ත ව්‍යාපෘතියේ බෙදාහැරීම් ප්‍රධාන, සම්ප්‍රේෂණ ප්‍රධාන සහ උප ප්‍රධාන නල එලීම් කොන්ත්‍රාත්තුව 2019 දෙසැම්බර් 11 දින නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත් කොන්ත්‍රාත් කාලය 2022 ජනවාරි 31 දක්වා අවස්ථා 06 කදී දීර්ඝ කරන ලදී. 2021 නොවැම්බර් 10 වන දින සිදුකරන ලද භෞතික විගණන පරීක්ෂණයට අනුව ඉතිරි මීටර් 5,080.28 ක නල එලීම් කටයුතු, මීටර් 72,048.15 ක පීඩන පරීක්ෂණ කටයුතු, බෝක්කු හරස් මාර්ග 50 ක් සහ කපාට කුටි 103 ක සවි කිරීම් අවසන් කිරීමට අවශ්‍ය විය. කෙසේ වෙතත් ඉහත ඉතිරි වැඩ 2022 ජනවාරි 31 වන විට මාස 03 ක් ඇතුලත අවසන් කළ හැකිද යන්න සැක සහිතය. | කුඩා විශ්කම්භය සහිත සී 1/සී 3 නල ජාලයේ සෝදාහැරීම් හා විෂබීජහරණය කෙරෙහි බලපෑමක් ඇත. ඍණාත්මක බලපෑම අවම කිරීම සඳහා, කැබලි අක්ෂර බී වෙත කලාප අනුව නිම කිරීමේ සැලැස්ම හඳුන්වා දෙන ලදී. මෙම සැලැස්ම මඟින් කළාප පදනමින් ඉතිරි වැඩ හඳුනාගෙන ඉහත සඳහන් ඉතිරි වැඩ නිම කරන ලෙස කොන්ත්‍රාත්කරුට උපදෙස් දෙන ලදී. | කැබලි අක්ෂර බී කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ඉසින්බැස්සගල කලාපයේ කිලෝ මීටර් 115 ක් දුරට යූපීවීසී, මෘදු යකඩ හා ගැල්වනයිස් යකඩ නල ඇතිරීම (කැබලි අක්ෂර සී 1 කොන්ත්‍රාත්තුව) සහ රඹෑව, නැගෙනහිර රඹෑව හා ඇතාකඩ කළාපයේ කිලෝමීටර් 119.6 දුරට යූපීවීසී, මෘදු යකඩ හා ගැල්වනයිස් යකඩ නල ඇතිරීම (කැබලි අක්ෂර සී 3 කොන්ත්‍රාත්තුව) යන බෙදාහැරීම් නල ඇතිරීම් කොන්ත්‍රාත්තුන් පිළිවෙලින් 2020 පෙබරවාරි 29 සහ 2019 ජූලි 15 දින සම්පූර්ණ කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තු යටතේ නල එළීමේ කටයුතු අවසන් වුවද, කැබලි අක්ෂර බී කොන්ත්‍රාත්තුව යටතේ බෙදාහැරීම් ප්‍රධාන හා සම්ප්‍රේෂණ ප්‍රධාන අවසන් වනතෙක් නල මාර්ග සෝදාහැරීම් හා විෂබීජහරණ කටයුතු කොනත්‍රාත්කරුවන් විසින් අත්හිටුවා තිබුණි. එසේ වුවද, සෝදාහැරීම් හා විෂබීජහරණ කටයුතු සිදුකිරීමට යටත්ව 2021 මාර්තු 12 වැනි දින ව්‍යාපෘතිය විසින් මෙම කොන්ත්‍රාත්කරුවන්ට අර්ධ නිමකිරීමේ සහතික නිකුත් කර තිබුණි. | කැබලි අක්ෂර බී හි ඉතිරි වැඩ නිම කිරීම සඳහා වන කලාප අනුව සැලැස්ම යටතේ, කැබලි අක්ෂර බී හි සෝදාහැරීම් හා විෂබීජහරණය කිරීමෙන් පසු මෙම ජාලයන්හි සෝදාහැරීම් හා විෂබීජහරණය සිදුකළ හැක. කැබලි අක්ෂර සී1/සී3 හි අවසාන බිල්පත සෝදාහැරීම් හා විෂබීජහරණය අවසන් වූ පසු කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ යුතුය. | කැබලි අක්ෂර සී 1 සහ කැබලි අක්ෂර සී 3 කොන්ත්‍රාත්තුන්හි සෝදා හැරීම් හා විෂබීජහරණ කටයුතු අවසන් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ව්‍යාපෘතියේ සවිස්තරාත්මක සැලසුම්කරණය සහ ඉදිකිරීම් අධීක්ෂණය සඳහා වන උපදේශන සේවා කොන්ත්‍රාත්තුව 2014 ජූනි 23 දින ප්‍රදානය කරන ලද අතර 2017 සැප්තැම්බර් 14 වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, කැබලි අක්ෂර ඒ සහ කැබලි අක්ෂර බී කොන්ත්‍රාත්තු නිමකිරීම ප්‍රමාද වීම හේතුවෙන් උපදේශන සේවා කොන්ත්‍රාත්තුවේ කාල සීමාව 2021 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර ඇත. ව්‍යාපෘතියේ උපදේශන සේවා කාලය දීර්ඝ කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා අමතර උපදේශන ගාස්තු ලෙස රුපියල් මිලියන 120.8 ක් සහ ජපන් යෙන් මිලියන 24.6 වැය කර ඇත. | ජපන් සහයෝගිතා ආයතනයට අනුව ව්‍යාපෘතිය අවසන් වනතුරු උපදේශන සේවාව ලබාගත හැක. සියලු පාර්ශවයන්ගේ ඉල්ලීම් ඇගයීමෙන් පසු ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ නිර්දේශ යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයා විසින් උපදේශකයින් සහ කොන්ත්‍රාත් කරුවන් වෙත ඉතිරි කටයුතු සම්පූර්ණ කිරීම සඳහා කාල දිගුවන් ලබා දෙන ලදී. | නියමිත කාල සීමාව තුළ විෂය ක්ෂේත්‍ර නියමයන්ට අනුව උපදේශන ආයතනයේ සම්පූර්ණ සේවාවන් ලබාගැනීමට පියවර ගත යුතුය. |

### 3.3 වැඩබිම් පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| | ව්‍යාපෘතියේ තුළුමුව පහසුකම්, ජල පවිත්‍රාගාරය, භූගත ජලාශ, ජල කුළුණු, කාර්යාල ගොඩනැගිලි, යාන්ත්‍රික හා විදුලි වැඩ සඳහා වන ප්‍රධාන ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2018 මාර්තු 13 දින ප්‍රදානය කරන ලද අතර එය 2020 අප්‍රේල් 20 වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, කොන්ත්‍රාත් කාලය 2021 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර ඇත. කොන්ත්‍රාත් කාර්ය සාධන වාර්තාවන්ට අනුව, 2020 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තුවේ අපේක්ෂිත භෞතික ප්‍රගතිය සියයට 91.4 ක් වුවද ළඟාකරගත් සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 73 ක් වැනි අඩු අගයක් විය. ඇතාකඩ ජල කුළුණ ආශ්‍රිත වැඩබිම්හි නල එළීම් කටයුතු, පසු පිරවුම් කටයුතු, භූමි අලංකරණ හා සිවිලිම් ගැසීමේ කටයුතු, වැඩබිම් පිරිසිදු කිරීමේ හා නිම කිරීමේ කටයුතු අවසන් කර නොමැති බව භෞතික විගණන පරීක්ෂාවේ දී අනාවරණය විය. | ජල පවිත්‍රාගාරයේ ඉදිකිරීම් දැනටමත් අවසන් කර ඇති අතර දැනට යාන්ත්‍රික ස්ථාපනයන් පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී. 2021 නොවැම්බර් 30 දිනට කැබලි අක්ෂර ඒ කොන්ත්‍රාත්තුව යටතේ සියයට 96.7 ක භෞතික ප්‍රගතියක් ළඟා කරගෙන ඇත. | ඉතිරි වැඩ ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කැබලි අක්ෂර බී කොන්ත්‍රාත්කරුගේ නල ගබඩා පරිශ්‍රයේ සිදුකරන ලද භෞතික විගණන පරීක්ෂාවේදී, මෘදු යකඩ නල හා සවි කිරීම්, අධිතාක්ෂණික පොලි එතලින් නල සම්මත අයුරින් ගබඩා කර නොතිබීම සහ නල ගබඩා පරිශ්‍රය නිසි පරිදි නඩත්තු කර නොතිබූ බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමහර නල හා උපාංග හානි වී තිබුණි | වර්ෂා කාලවලදී ඉලුක් සහ මාන සීඝ්‍ර ලෙස වර්ධනය වීම නිසා නිසි අයුරින් ගොඩ නොගැසූ නල විධිමත් ලෙස ගොඩ ගැසීමට දැනටමත් පියවර ගෙන ඇත.<br>හානි වූ ඇතැම් නල ප්‍රවාහනයේදී හා ගොඩ බෑමේදී හානි වූ නල වේ. | සම්මත අයුරින් නල ගබඩා කර ගබඩා පරිශ්‍රය නිසි ලෙස නඩත්තු කිරීමට පියවර ගත යුතුය. |

## 3.4 සම්පත් ඌණ උපයෝජනය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘති ණය ගිවිසුමට අනුව, ණය ආපසු ගෙවීමට නියමිත දිනය 2020 මාර්තු 20 විය. පසුව, කැබලි අක්ෂර ඒ සහ කැබලි අක්ෂර බී කොන්ත්‍රාත්තු නිම කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ණය කාලය 2022 ජූලි 5 දක්වා දීර්ඝ කර ඇත. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 වන දිනට ණය උපයෝජනය ජපන් යෙන් මිලියන 3,214.81 ක් හා එය එකඟ වූ ණය මුදලින් සියයට 62.23 ක් විය. තවද, රජය විසින් 2020 මාර්තු සිට 2021 සැප්තැම්බර් 17 දක්වා ණය නියෝජිතායතනය වෙත ජපන් යෙන් මිලියන 558.51 ට සමාන රු. මිලියන 994.38 ක් ආපසු ගෙවා ඇත. ඒ අනුව ව්‍යාපෘතිය අවසන් කිරීමට සහ ණය මුදල සම්පූර්ණයෙන්ම උපයෝජනය කිරීමට පෙර ණය ආපසු ගෙවීම ආරම්භ කර ඇත. | ප්‍රධාන වශයෙන්, ප්‍රධාන කොන්ත්‍රාත් පැකේජ දෙක ප්‍රදානය කිරීමේ ප්‍රමාදය හේතුවෙන්, ණය වියපැහැදම් කාලය 2022 ජූලි දක්වා දීර්ඝ කර ඇත. නමුත් ජපන් සහයෝගිතා ආයතනය විසින් ණය ආපසු ගෙවීමේ කොන්දේසි වෙනස් කර නොමැති අතර එය මූලික ගිවිසුමට අනුව පවතී. | ව්‍යාපෘතිය අවසන් කිරීමට කඩිනම් පියවර ගත යුතු අතර ණය ආපසු ගෙවීමේ කොන්දේසි වෙනස් කරන ලෙස ජපන් සහයෝගිතා ආයතනයෙන් ඉල්ලා සිටිය යුතුය. |

## 3.5 මතභේදයට තුඩු දෙන කරුණු

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| (අ) | බිල්පත් ගෙවීම සඳහා විදේශ අරමුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන්, කැබලි අක්ෂර ඒ කොන්ත්‍රාත්තුවට අදාල රු. මිලියන 868.74 ක් සහ ඩොලර් 927,547 ක වටිනාකම වූ කොන්ත්‍රාත් බිල්පත් ගෙවීම් හා කැබලි අක්ෂර බී කොන්ත්‍රාත්තුවට අදාලව රු. මිලියන 595.62 ක් සහ ජපන් යෙන් මිලියන 892.522 ක වටිනාකම වූ කොන්ත්‍රාත් බිල්පත් | මෙසේ සිදු වූයේ සියළුම ව්‍යාපෘති සඳහා විදේශ අරමුදල් වෙන් කිරීම් රජය විසින් සීමා කිරීම හේතුවෙනි. සාමාන්‍යාධිකාරීගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු කැබලි අක්ෂර ඒ හා බී කොන්ත්‍රාත් කොන්දේසි | ණය අරමුදල් මගින් අදාළ වියදම් ගෙවීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගෙවීම් 2018 ජනවාරි සිට 2020 ජූලි දක්වා ප්‍රමාද වී තිබුණි. මෙම හිඟ බිල්පත් ගෙවීම් 2020 වර්ෂයේ දී පියවා තිබුණද, කොන්ත්‍රාත්කරුවන් විසින් කොන්ත්‍රාත් කොන්දේසි වලට අනුව පිළිවෙලින් රු. මිලියන 21.39 ක්, ඩොලර් 10,429 ක් සහ ජපන් යෙන් මිලියන 1.32 ක් මූල්‍ය ගාස්තු ලෙස අයකරගෙන තිබුණි. එසේ වුවද, ණය ගිවිසුමට පටහැනිව, මූල්‍ය ගාස්තුවලින් සියයට 98 ක් 2021 වසරේ රජයෙන් ලද මුදලින් ගෙවනු වෙනුවට ණය මුදල් මඟින් වැරදි ලෙස ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | අනුව ණය ප්‍රතිපාදන තුළින් මූල්‍ය ගාස්තු ගෙවීම සිදු කරන ලදී. | |
| (ආ) | ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, සාමාන්‍ය පරිපාලන වියදම් ණය මුදලින් මූල්‍යණය කිරීමට සුදුසුකම් නොලබයි. නමුත්, ඊට පටහැනිව ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ(පී.එම්.යූ) කාර්ය මණ්ඩලය සඳහා විචලතා නියෝග යටතේ රු.මිලියන 3.6 ක මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි. | ව්‍යාපෘතිය යටතේ බඳවා ගන්නා ලද කාර්ය මණ්ඩලය හිඟවීම හේතුවෙන් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙතින් ලබාගත් අනුමැතිය මත විචලතා නියෝග කමිටුවට ඉදිරිපත් කර මෙම ගෙවීම් කරනු ලැබේ. | ණය අරමුදල් මඟින් අදාළ වියදම් ගෙවීමට පියවර ගත යුතුය. |
| (ඇ) | අදියර 01 හි ව්‍යාපෘති සංදේශයට අනුව, ව්‍යාපෘතිය නිම කිරීමට සැලසුම් කළ දිනය 2018 පෙබරවාරි විය. පසුව, කැබලි අක්ෂර ඒ සහ කැබලි අක්ෂර බී කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම ප්‍රමාද වීම හා දුර්වල කාර්යසාධනය හේතුවෙන් එය 2022 ජූලි මාසය දක්වා දීර්ඝ කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ අනෙකුත් වැඩබිම් කාර්යාල නඩත්තු කිරීම සඳහා අමතර පොදුකාර්ය පිරිවැයක් ලෙස ව්‍යාපෘතියට රු.මිලියන 132.7 ක් දැරීමට සිදුවිය. | පූර්ව සුදුසුකම් අදියරේ දී කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාජ ලියකියවිලි හේතුවෙන් කැබලි අක්ෂර ඒ සහ කැබලි අක්ෂර බී කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම ප්‍රමාද වීම, පළපුරුද්ද පිළිබඳ සහතිකයන් ට එරෙහිව පෙත්සමක් මඟින් චෝදනා කිරීම, අමාත්‍ය මණ්ඩලය පත් කළ විශේෂ ප්‍රසම්පාදන කමිටුවේ හා ජපන් සහයෝගීතා ආයතනයේ අනුමැතීන් ලබා ගැනීමට ප්‍රමාද වීම යනාදිය. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘතිය නිම කිරීමට පියවර ගත යුතුය. |

**3.6 පද්ධති හා පාලනයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| 2010 ජූලි 26 දිනැති අංක 5 දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛයට අනුව, ව්‍යාපෘතියේ කටයුතු 2020 වර්ෂයේ දී ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය උතුරුමැද සහාය සේවා මධ්‍යස්ථානයෙහි අභ්‍යන්තර විගණනය මගින්ද විගණනය කරනු ලැබේ. | 2020 වර්ෂයේ දී අභ්‍යන්තර විගණනය සිදුකර නොමැති බව ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය තහවුරු කිරීම හේතුවෙන් අභ්‍යන්තර විගණනය සිදුකර නියමිත වේලාවට වාර්තා ඉදිරිපත් කළ යුතුය. |